# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය

# மாவட்டச் செயலகம், திருகோணமலை

# District Secretariat, Kachcheri, Trincomalee

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳව කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතනභාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்றத்தின் அரச கணக்குக்குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பான நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Submission of the observations of Hon. Minister in charge of the institution and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119 (4)

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ත්‍රිකුණාමලය**

**පළමු කොටස**

| | වාර්තාවෙන් හඳුනාගත් ලද අඩුපාඩු | අඩුපාඩුව නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/ වත්මන් තත්ත්වය |
|---|---|---|
| 01 | අනවසර ඉඩම් අල්ලා ගැනීම් පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත . | දැනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබෙ . |
| 02 | දීර්ඝ කාලීන බලපත්‍ර නිකුත් කිරීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත. | දැනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තොරතුරු ඇතුළත් දීර්ඝ කාලීන බලපත්‍ර නිකුත් කිරීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ. |
| 03 | අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත. | සෑම වසරකම අවදානම් ලේඛණය නිසි පරිදි සකස් කර එම තොරතුරු ජාතික විගණන කාර්යාලය වෙත යොමු කර ඇති අතර ,මෙම අවදානම් ලේඛණ අඛණ්ඩව යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත. |
| 04 | සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත. | සියලු වාහන වල අයිතිය මෙ වන විට තහවුරු කර ඇත. |
| 05 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණනකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා මේ වන විට විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. |
| 06 | වාහනයක් ගර්භිත වී මාස 8 වඩා අඩු කාලයකදි අපහරණයය කර නොතිබුණි. | දැනට ගර්භිත වී ඇති අදාළ වාහනයේ ලියාපදංචි අයිතිකරු හඳුනාගෙන ඇති බැවින්, එම ආයතනයෙන් දිස්ත්‍රික් ලේකම්ගේ නමට ලියාපදිංචි කිරීමට මූලික කටයුතු සිදු කර ඇත. දිස්ත්‍රික් ලේකම් නමට ලියාපදිංචි කල වහාම අපහරණය කිරීමේ කටයුතු සිදු කල හැකි බව කාරුණිකව දන්වා සිටිමි. |
| 07 | සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුනි. | සෑම වාහනයක් සඳහා ලොග් පොතක් යාවත් කාලිනව භාවිතා කරයි. |
| 08 | රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි. | මේ වන විට සියලු වාහන අනතුරු සම්බන්ධයෙන් පරික්ෂණ කටයුතු අවසන් කොට ඇති අතර මු.රෙ ප්‍රකාරව නිසි කටයුතු සිදු කර ඇත. |
| 09 | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | හිග ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර ඇත. |
| | දෙවන කොටස | |
| 10 | මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණය කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | අදාල කාල වකවානුවේදී රට තුළ පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ නමුත් මාස 03 කට වරක් හෝ අදාල රැස්වීම පැවැත්වීමට කටයුතු කර ඇත. එසේම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ ගරු සභාපතිතුමා විසින් අදාළ රැස්වීම පැවැත්වීම සඳහා දින ලබා දීමේදි පාර්ලිමේන්තු පවත්වනු ලබනු දින හැර වෙනත් දිනයන් ලබා දෙන බැවින් යම් අවස්ථා වලදී සෑම මසකදීම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා නොමැත. |

| | | |
|---|---|---|
| 11 | දිස්ත්‍රික් මිළ නියම කිරීමමේ කමිටු මාසිකව රැස්වීම් පවත්වා නොතිබුණි. | මිළ නියම කිරිමේ රැස්විම වර්ෂයකට දෙවරක් පැවැත්වීමට කටයුතු කර ඇත. |
| 12 | ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි. | 2023 වර්ෂයට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අදාළ වන පරිදි තිරසර සංවර්ධන සැලැස්මක් හා ඉලක්ක සකස් කර දෙන ලෙසට තිරසර සංවර්ධන කවුන්සිලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත. කෙසේ වුවද 2024 වර්ෂයට අදාල සැලැස්ම සකස් කර ඇත. |
| 13 | හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තිරණය කර නොතිබුණි. | ඉලක්ක තිරණය කර ඇත. ඒ අනුව තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කර ඇත. |
| 14 | හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි. | ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර ඇත. එමඟින් ප්‍රගතිය මැනීම සිදුකර ඇත. |
| 15 | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණයන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය | සැලසුම් කළ බොහොමයක් ක්‍රියාකාරකම් සිදු කර ඇත.<br><br>විගණකාධිපති විසින් වරින් වර පෙන්වා දී ඇති අඩු පාඩු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී සමාලෝචනය කරනු ලැබේ. |
| 16 | හඳුනාගත් කාර්ය දර්ශකයේ ළඟා වීම 24%ට වඩා අඩු ප්‍රමාණයෙන් විය. | මේ වන විට කාර්ය දර්ශකය නියමිත ප්‍රමාණයට ලගා වී ඇත.(2024 වර්ෂයේ 80% කි) |
| 17 | දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මත් ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් කාර්තුවකට 01 බැගින් රැස් වී නොතිබුණි. | අදාළ කාල සීමාව තුල මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු පවත්වා නැති අතර මේ වන විට මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු පවත්වනු ලැබේ. |
| 18 | සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි. | ප්‍රතිපාදන සීමාවන්ට යටත්ව සියලු පුහුණුවීම් ලබා දී ඇත. |

..............................
ඩබ්.ජී.එම් හේමන්ත කුමාර
දිසාපති හා දිස්ත්‍රික් ලේකම්,
ත්‍රිකුණාමළය.

ඩබ්ලිව්.ජී.එම්.හේමන්ත කුමාර
දිසාපති හා දිස්ත්‍රික් ලේකම්
ත්‍රිකුණාමලය

..............................
පී.ජෙයබාස්කර්
ප්‍රධාන ගණකාධිකාරි,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
ත්‍රිකුණාමළය.

පි. ජෙයබාස්කර්
ප්‍රධාන ගණකාධිකාරි
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ත්‍රිකුණාමලය

**ලේකම්තුමාගේ නිර්දේශය**

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

**ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග**

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2026 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළගා කර ගැනීමට අපේක්ෂා කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න (පා.ම.)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය

මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍ය
නිදහස් චතුරශ්‍රය - කොළඹ 07.